# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1408 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 30/08/2024 පැය 2110

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - වැල්ලවාය පොලිස් වසම.

2024.08.29 වන දින සවස් කාලයේ වැල්වාය පොලිස් වසමේ යාලබෝව වැල්ලවාය ප්‍රදේශයේ නිවසක ඇතිවූ පවුල් ආරවුලක් අතරතුර බිම ඇද වැටුණු පුද්ගලයෙකු ප්‍රතිකාර සඳහා වැල්ලවාය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට වැල්ලවාය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් වූ යාලබෝව වැල්ලවාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මරණය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී මරණකරු හා බිරිද අතර සිදුවූ ආරවුලකදී කොස්සකින් පහරදීම හේතුවෙන් මෙම ඝාතනය සිදුව ඇති බවට අනාවරණය වී ඇත. **ඝාතනය සම්බන්ධයෙන් වයස අවරුදු 60 ක් වූ මරණකරුගේ බිරිද හා වයස අවරුදු 46 ක් වූ මරණකරුගේ බෑනා** අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය වැල්ලවාය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. කොකේන් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.

2024.08.29 වන දින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත බොරලැස්ගමුව පොලිස් වසමේ බෙල්ලන්විල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **කොකේන් මත්ද්‍රව්‍ය කිලෝ 03 ග්‍රෑම් 117 මිලිග්‍රෑම් 617 සමඟ සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 24 ක් වූ මැලේසියානු ජාතික කාන්තාවකි.**

සැකකාරිය ඩුබායි රාජ්‍යයේ සිට 2024.08.29 වන දින මෙරටට පැමිණ ඇති අතර බෙල්ලන්විල ප්‍රදේශයේ හෝටලයක රැඳී සිටියදී අත්අඩංගුවට ගෙන ඇත. මෙම මත්ද්‍රව්‍ය සැකකාරිය විසින් රැගෙන එන ලද ගමන් බෑගයේ ටොෆි ටින් තුල සඟවා තිබියදී සොයාගෙන ඇත. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**